**ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය - 2022**

**-----------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයින් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය හා කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව.
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | -------------------- | -------------------------- | ----------- |
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07හි 65 හා 20හි 103 ඡේද අනුව, පිළිවෙලින් ජංගම නොවන වත්කම්වල හා අස්පෘශ්‍ය වත්කම්වල සඵල ආයු කාලය සමාලෝචනය කර නොතිබීම හේතුවෙන් සම්පූර්ණයෙන් ක්ෂය වූ රු.1,405,884,194ක වත්කම් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් භාවිතා කරමින් පැවැතුණි. ඒ අනුව ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 අනුව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙළ කිරීම සඳහා මේ වන විට කටයුතු කරමින් පවතින බව හා එය පිළියෙල කළ පසු මෙම අඩුපාඩු සියල්ල ඉවත් කිරීමට හැකියාව පවතින බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය කඩිනම් කිරීමේ ලෝක බැංකු ව්‍යාපෘතිය (AHEAD) සඳහා ඉකුත් වර්ෂවල දී ලද රු.97,480,511ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 අනුව අතීතානුයෝගීව ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉකුත් වර්ෂවල වියදම් හා කෙරීගෙන යන වැඩ ගිණුම් ශේෂය ද සමඟ ගිණුම්ගත කිරීම හේතුවෙන් 2022 වර්ෂයේ ව්‍යාපෘතියේ සත්‍ය ආදායම හා වියදම ඉක්මවා ගිණුම්ගත වී ඇති බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | --------------------------- | ----------- |
| (අ) | බැඳුම්කර කඩකළ නිලධාරීන්ගෙන් ඉකුත් වර්ෂයේදී අයකරගෙන තිබුණු රු.4,440,449ක් බැඳුම්කර කඩකිරීම් අරමුදලට මාරුකර | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නොතිබීමෙන් 2022 දෙසැම්බර් 31 දිනට එම අරමුදලේ ශේෂය හා පුනරාවර්තන ඒකාබද්ධ අරමුදලේ ඌනතාව එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ආ) | දේපළ පිරියත හා උපකරණ ක්ෂය ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය රු.25,487,787ක් වැඩියෙන් ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ අතිරික්තය හා දේපළ පිරියත හා උපකරණවල ශුද්ධ අගය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාල ක්ෂය නිවැරදිව ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2022 ජුලි මාසයේ වැඩ අවසන් කර තිබුණු ගොඩනැගිල්ලක් සඳහා කොන්ත්‍රාත්කරු වෙත ගෙවිය යුතුව පැවති රු.1,255,557ක් ගිණුම්ගත කර නොතිබීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට දේපළ පිරියත උපකරණ ශේෂය හා ප්‍රාග්ධන ණයහිමි ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | අදාළ ගෙවීම් වවුචරය මුදල් අංශයට ලැබී ඇත්තේ 2023 අප්‍රේල් මාසයේදී බව. | වර්ෂයට අදාල වියදම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුළ ලොකර් සහ ඇඳන් අලුත්වැඩියා කිරීම සඳහා වැයකළ රු.5,628,910ක පුනරාවර්තන ස්වරූපයේ වියදම ප්‍රාග්ධනිත කර තිබීමෙන් වාර්ෂික අතිරික්තය හා දේපළ පිරියත හා උපකරණ වටිනාකම පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අදාළ අලුත්වැඩියා කිරීම මඟින් එම වත්කම්වල ඵලදායී ජීව කාලය වැඩි වන බවට තත්ත්ව වාර්තා ලබා දී ඇති නිසා ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රමිත 07 අනුව ප්‍රාග්ධන වියදමක් ලෙස හඳුනාගත් බව. | පිළිතුරු පිළිගත නොහැක. පුනරාවර්තන හා ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | කෘෂි විද්‍යා පීඨ ගොඩනැගිල්ල ඉදිරිකිරීමට ලබාදුන් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම්වල අවකරණ ගිණුම්ගත කිරීමේදී වැට් බදු රහිතව සටහන් කිරීම නිසා රු.6,020,086කින් නොනිමි වැඩ වටිනාකම අඩුවෙන් ද, නොපියවූ අත්තිකාරම් ශේෂය වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | VAT සහිතව අත්තිකාරම් ලබා දුන්නද මූලධන අංශය විසින් ගෙවීම් වවුචර් සකස් කර එවීමේ දී VAT රහිතව අවකරණයන් සිදු කරන හෙයින් ගිණුම්ගත කිරීමද එලෙසම කරනු ලබන බව. | මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | වෛද්‍ය පීඨයේ පැරා සායන ගොඩනැගිල්ල ඉදිකිරීමට ලබාදුන් රු.28,265,340ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගිණුම්ගත නොකිරීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට එම අත්තිකාරම් ගිණුමේ ශේෂය හා ප්‍රාග්ධන ප්‍රදාන එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි | ඉදිරි ගිණුම් වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයයේ දෙසැම්බර් 31 දිනට ශිෂ්‍යාධාර රු.44,852,000ක් අයවිය යුතුව පැවතියද, එය රු.38,180,000ක් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් වර්ෂයේ ශිෂ්‍යාධාර ප්‍රදාන ආදායම | මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හා ලැබිය යුතු ශිෂ්‍යාධාර ශේෂය රු.6,672,000ක් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ඍ) | 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු එකතුව රු.170,642,885ක් වූ බැඳුම්කර වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන සටහනකින් හෙළිදරව් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | අයවිය යුතු බැඳුම්කර වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |
| (එ) | ව්‍යවහාරික විද්‍යා පීඨයේ පැවති තොග වටිනාකම ගණනය කිරීමේදී ඒකක පිරිවැය නිවැරදිව හඳුනා නොගැනීම හේතුවෙන් රසායනික ද්‍රව්‍ය අයිතම 10ක ශුද්ධ වටිනාකම රු.5,232,260ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. එම නිසා ඉතිරි තොග ශේෂය හා වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එමෙන්ම, තොග ලේඛන හා බින් කාඩ්පත් නිවැරදිව නඩත්තු නොකිරීම නිසා ඒකක පිරිවැය හඳුනාගත නොහැකි වූ තොග අයිතම 106ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | තොග භෞතික සත්‍යාපනයේදී බින්කාඩ්වල අඩුපාඩු ඇති බවත්, හඳුනා ගන්නා ලද රසායනික ද්‍රව්‍යවල මිල නිශ්චය කිරීමේ ප්‍රභවයන් ඉදිරිපත් නොවූ බවත් (Invoice/GRN) වාර්තා කර ඇති බැවින් සත්‍ය තොග වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ගෙන ඇති බව. | පිළිතුර පිළිගත නොහැක. මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඒ) | ERASMUS ව්‍යාපෘති ප්‍රදාන මගින් ව්‍යවහාරික විද්‍යාපීඨය සඳහා සමාලෝචිත වර්ෂයේදී මිල දී ගෙන තිබුණු රු.2,683,360ක වත්කම් ගිණුම්ගත කර නොතිබීමෙන් දේපළ පිරියත උපකරණ ශේෂය හා ප්‍රාග්ධන ප්‍රදාන එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මෙම වත්කම්, ව්‍යාපෘති කාලය අවසානයේදී ප්‍රාග්ධනිත කිරීම හා ඉදිරි වර්ෂවල සිට මේ බව මූල්‍ය ප්‍රකාශනවල සටහනකින් දැක්වීම සිදු කරන බව. | ප්‍රාග්ධන ප්‍රදාන මගින් මිලදී ගනු ලබන වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඔ) | ඉකුත් වර්ෂ දෙකක් සඳහා රු.468,000ක විගණන ගාස්තු අධි වෙන්කිරීම වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදුකර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාළ විගණන ගාස්තු වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල වෙන්කිරීම් සිදුකර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාල විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදනයන් සිදුකළ යුතු අතර ඉකුත් වර්ෂවලට අදාල අධි/ඌන වෙන්කිරීම් ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (ඕ) | ඉකුත් වර්ෂයේ දේපළ ණයවල පොලී අනුපාතය අඩුවීම නිසා බැංකුවෙන් ආපසු ගෙවූ රු.1,412,765ක් ඉකුත් වර්ෂයේ ලාභයට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර, ගිණුම් වර්ෂය අවසානයට ලැබිය යුතු පොලී ආදායම රු.1,274,461ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.2,687,226ක් හා ලැබිය යුතු පොලී ආදායම | ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වර්ෂයට අදාල ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.1,274,461ක් වැඩියෙන් ද පුනරාවර්තන ඒකාබද්ධ අරමුදල රු.1,412,765ක් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | | |
| (ක) | උපචිත වියදම් රු.3,568,546ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබීම හා ඉකුත් වර්ෂයට අදාළ වියදම් රු.1,104,343ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.4,672,889ක් අඩුවෙන් දැක්වුණු අතර පුනරාවර්තන ඒකාබද්ධ අරමුදල රු.1,104,343කින් හා ජංගම බැරකම් රු.3,568,546කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාල වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ග) | 2023 වර්ෂයට අදාළ වූ හා එම වර්ෂයේදීම ගෙවා තිබුණු වියදමක් 2022 වර්ෂයේ පෙර ගෙවීම් ගිණුමට හා උපචිත වියදම් ගිණුමට රු.1,105,231ක් බැගින් පිළිවෙලින් හර හා බැර කර තිබුණි. මේ නිසා ජංගම වත්කම් හා ජංගම බැරකම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2023 දී මුදල් ගෙවා ඇත්තේ අදාළ ණය හිමි ගිණුමෙන් අඩු වී යන පරිදි බව. | වර්ෂයට අදාල වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ච) | ඉකුත් වර්ෂවලට අදාළව ගෙවිය යුතු මූලධන වියදම් රු.8,510,176ක් විධිමත් අනුමැතියකින් තොරව ජංගම නොවන වත්කම්වලට එරෙහිව කපාහැර තිබුණි. එමෙන්ම, එලෙස කපාහරින ලද වත්කම් මොනවාද යන්න විස්තරාත්මකව හඳුනාගෙන නොතිබුණි. තවද, එම වත්කම්වලට අදාළ ක්ෂය වෙන්කිරීම් රු.7,852,560ක් අදාළ වත්කම් ගිණුම්වලට හර කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට දේපළ පිරියත හා උපකරණ රු.657,616කින් හා ගෙවියයුතු මූලධන වියදම් රු.8,510,176කින් අඩුවෙන් දැක්වුණු අතර ක්ෂය වෙන්කිරීම් ගිණුමේ ශේෂය රු.7,852,560ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | දිගු කාලීනව උපචිත කර පැවති ප්‍රාග්ධන වත්කම් සඳහා වන ශේෂයන්ට අදාළ ගෙවීම් වවුචර්, ගිණුම් වර්ෂය අවසාන වන තෙක් මුදල් අංශයට ඉදිරිපත් වී නොතිබීම නිසා උපචිත ලේඛන ලබා දුන් අංශවලින් ශේෂ සනාථන ලිපි ලබා ගෙන උපචිතකර පැවති ප්‍රාග්ධනිත වත්කම් මුදල් රෙගුලාසි ප්‍රකාරව ආදායමට නියාදනය කර ඇති බව හා ක්ෂය ගිණුම්ගත කිරීමේ දෝෂය ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කරන බව. | පිළිතුරු පිළිගත නොහැක. අදාළ වත්කම් විශ්වවිද්‍යාලය වෙත ලැබී නොමැති බව තහවුරුකර ගැනීමකින් තොරව හා විධිමත් අනුමැතියකින් තොරව වත්කම් කපාහැරීම සිදු නොකළ යුතුය. |

### 1.5.4 ගෙවියයුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේ සිට මහපොළ භාරකාර අරමුදලට ගෙවිය යුතු රු.2,201,150ක් හා 2018 වර්ෂයේ සිට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන | ඉදිරියේ දී නිරවුල් කිරීමට කටයුතු කරනු ලබන බව. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

කොමිෂන් සභාවට ගෙවිය යුතු රු.2,380,750ක් සමාලෝචිත වර්ෂය තුළ දී ද නිරවුල් කර නොතිබුණි.

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | ------------------- | -------------------- | ------------------ | ----------- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | 371(5) රෙගුලාසිය | 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අවස්ථා 34ක දී නිකුත් කර තිබුණු විවිධ අත්තිකාරම් රු.7,475,251ක් පියවා නොතිබුණි. | වාචිකව හා ලිඛිතව අත්තිකාරම් ලබා ගත් පාර්ශවයන් දැනුවත් කළ ද පියවීම සිදු කර නැති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 371(2)(ආ) | අතුරු අග්‍රිම ලබාදිය හැකි රු.100,000ක් වූ උපරිම සීමාව ඉක්මවා අවස්ථා 15ක දී රු.100,470ක සිට රු.552,330ක් අතර පරාසයක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. තවද අවස්ථා 15ක දී එකතුව රු.646,456ක් වූ අත්තිකාරම් මාණ්ඩලික තත්ත්වයේ නොවන නිළධාරීන් වෙත නිකුත් කර තිබුණි. | බොහෝ අංශවල මාණ්ඩලික නිලධාරීන් සේවයේ නොමැති අවස්ථා ඇත. එවැනි අවස්ථාවලදී ගණන් දීමේ නිලධාරියාගේ නිර්දේශය හා අනුමැතිය යටතේ ස්ථිර කාර්ය මණ්ඩලයට පමණක් අත්තිකාරම් ලබා දී ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | මුදල් රෙගුලාසි 571 | 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය අතර කාලයට අදාළ රු.35,773,655ක රැඳවුම් මුදල් නිරවුල් කර නොතිබුණි. | ස්ථාවර වත්කම් මිල දී ගැනීමේ දී රඳවා ගත් මුදලක් බැවින් ඒවා නැවත ගෙවීමට බැඳී සිටින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය හා 2003 | අදාළ අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ | ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇති මුදල, විශ්වවිද්‍යාලය සතු අතිරික්ත මුදලක් | මුදල් පනත හා චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ |

| | | | | |
|---|---|---|---|---|
| | ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 8.2.2 ඡේදය | රු.218,807,919ක් ස්ථාවර තැන්පතු 17ක ආයෝජනය කර තිබුණි. | නොවන අතර මෙම අරමුදල් විශ්වවිද්‍යාලීය මුදල් කමිටු හා පාලක සභා අනුමැතිය සහිතව තාවකාලික පදනමට ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇති බව. | යුතුය. |
| (ඈ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය V පරිච්ඡේදය 7 ඡේදය | 2000 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා අධ්‍යයන නිවාඩු ලබා විදේශගත වූ නිලධාරීන් 25 දෙනෙකුගෙන් බැඳුම්කර කඩකිරීම හේතුවෙන් අයකරගත යුතු රු.140,721,766ක් 2023 මැයි මාසය වන විටත් අයකර නොතිබුණි. | 2023 මැයි 12 දින වන විට රු.29,921,119ක් අය කරගෙන ඇති බව. | උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | රාජ්‍ය වියදම් කළමනාකරණය සම්බන්ධයෙන් භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද 2022 අගෝස්තු 08 දිනැති අංක 04/2022 දරන චක්‍රලේඛයේ 2.9 ඡේදය | දේශීය අරමුදල් භාවිතා කරමින් සිදුකරන විදේශ සංචාර හෝ පුහුණු වැඩසටහන් අත්හිටුවා තිබුණද, ඊට පටහැනිව මහාචාර්යවරියකට සප්ත වාර්ෂික නිවාඩු මත විදේශගතවීම සඳහා ගුවන් ටිකට්පත් මිල දී ගැනීම වෙනුවෙන් 2022 දෙසැම්බර් 14 දින රු.1,057,600ක් ගෙවා තිබුණි. | බැඳුම්කර උල්ලංඝනය කළ සේවකයන් විසින් ගෙවනු ලබන මුදල් මඟින් මේ සඳහා ප්‍රතිපාදන ලබා දීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා දී ඇති බව. | භාණ්ඩාගාර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | ස්වයං මූල්‍ය උත්පාදිත ක්‍රියාකාරකම් (Self-Financing Activities) වියදම් ආවරණය කර ගැනීමේ පදනම මත (Cost Recovery) සහ ලාභ ඉපැයීම අරමුණු කර නොගත් (Non Profited Basis) පදනම මත ක්‍රියාත්මක කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එවැනි ක්‍රියාකාරකම් 02ක් මඟින් රු.74,908,394ක ශුද්ධ මූල්‍ය අතිරික්තයක් ලබා ගෙන තිබුණි. | ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද අතිරික්තය, එම චක්‍රලේඛය අනුව Cost Recovery සහ Non Profited පදනමට ගෙන ඒමට ශුද්ධ ඉපයීම සංවර්ධන වැය ශීර්ෂ වෙත මාරු කිරීම සිදු කර ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා බැඳුනු මෙහෙයුම් අත්පොතෙහි 6.6 ඡේදය | මුදල් වර්ෂය අවසන් වී දින 60ක් තුළ එම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම 2023 මාර්තු 20 දින දක්වා ප්‍රමාද වී තිබුණි. | අදාළ නියමාවලීන්ට අනුකූලව ඉදිරියේදී කටයුතු කරනු ලබන බව. | නියමිත කාලසීමාව තුළ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |

## 02. මූල්‍ය සමාලෝචනය

**මූල්‍ය ප්‍රතිඵලය**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.381,445,894ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.825,532,686ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.444,086,792ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන රු.189,137,306කින් අඩුවීම, මෙහෙයුම් වියදම් රු.324,962,891කින් හා මෙහෙයුම් නොවන වියදම් රු.105,110,110කින් වැඩිවී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | -------------------------------- | ----------- |
| (අ) | 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ස්ථාවර වත්කම් ලේඛනය සඳහා මෘදුකාංගයක් සැකසීම හා මෘදුකාංගයට දත්ත ඇතුළත් කිරීම සඳහා අවස්ථා 08 කදී එකතුව රු.1,370,300 ක් ගෙවා තිබුණ ද, 2023 මැයි මාසය වනවිටත් ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීමේ කාර්යය නිම කිරීමට නොහැකි වී තිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීම සඳහා සියලුම පීඨ ආවරණය වන පරිදි සාමාජිකයින් හත් දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කර ඇති අතර මේ වන විට එහි කටයුතු සියයට 80 ක් පමණ නිම කර ඇති බව. | ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |
| (ආ) | 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ දී විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ නිලධාරීන් 335දෙනෙකු වෙත පර්යේෂණ දීමනා වශයෙන් එකතුව රු.433,826,884ක් ගෙවීම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කිසිදු නිලධාරියෙකු ඊට අදාළ පර්යේෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | දැනටමත් ප්‍රසිද්ධ කරන ලද පර්යේෂණ වාර්තා සඳහා නැවත වාර්තා ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන බව. (ආචාර්යවරුන් වැඩි පිරිසක් මේ යටතට ගැනේ.) එමෙන්ම, කරගෙන යමින් පවතින පර්යේෂණ සඳහා පර්යේෂණ ප්‍රදාන කමිටුවේ නිර්දේශය මත දීමනා ලබා දෙන බව හා නව පර්යේෂණ යෝජනා | ප්‍රසිද්ධ කරන ලද පර්යේෂණ වාර්තා මත ඉදිරි වසර 03ක් සඳහා පමණක් දීමනා ගෙවිය හැකි වේ. එබැවින් පර්යේෂණ වාර්තා ඉදිරිපත් කළයුතු සියලු නිලධාරීන්ගෙන් එම වාර්තා ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සඳහා ප්‍රගති වාර්තා ලබා ගැනීමට කටයුතු කරන බව. | |
| (ඇ) | අධ්‍යයන කාර්යය මණ්ඩලයට අයත් නිලධාරීන් 41දෙනෙකු වෙත 2015 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා රු.66,258,551ක පර්යේෂණ ප්‍රදාන ලබා දී තිබුණ ද, එම පර්යේෂණ ව්‍යාපෘති මගින් ජාතික හා අන්තර්ජාතික වශයෙන් ලද දායකත්වය පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | එම තොරතුරු ලබා නොදීමට විශ්වවිද්‍යාල ආචාර්ය සංගමය විසින් තීරණය කර ඇති බව. | විගණනය විසින් ඉල්ලුම් කරනු ලබන තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2014 වර්ෂයේදී රු.123,052,693ක් වැයකර ඉදිකර තිබුණු විශ්වවිද්‍යාලයේ ක්‍රීඩා පිටිය සහ ක්‍රීඩාගාරයේ පැවති අඩුපාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු බවට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව 2017 අගෝස්තු 09 දින නියෝග කර තිබුණද, එහි රු.5,156,160ක් වූ රැඳවුම් මුදල් භාවිතා කර ක්‍රීඩා පිටිය පිළිසකර කිරීමට 2023 මැයි මාසය වන විටත් කටයුතු කර නොතිබුණි. | රඳවා ගැනීමේ මුදල් භාවිතා කර ක්‍රීඩා පිටිය පිළිසකර කිරීමට සිදුවන බව 2022 දෙසැම්බර් 29 දින ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශය (CECB) වෙත දැනුම් දී ඇත. නමුත් එම තීරණයට ඔවුන් එකඟ නොවන බවත් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීමට සිදුවන බවත් දන්වා ඇති බව. | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා තීරණය පරිදි කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | -------------------------------- | ----------- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාලයේ පවිත්‍රතා හා උද්‍යාන නඩත්තුව වෙනුවෙන් 2021 දෙසැම්බර් මාසයේ දී රු.61,440,000කට ගිවිසුම් ගත වී තිබුණි. ගිවිසුමේ කොන්දේසි අනුව පවිත්‍රතා සේවකයන් ඇඟිලි සළකුණු යන්ත්‍ර මගින් සිය පැමිණීම හා පිටවීම සටහන් කළ යුතු වුවද, සියලුම සේවකයින් එයට අනුගතව කටයුතු කර නොතිබුණි. එමෙන්ම, 2022 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ විශ්වවිද්‍යාලීය පවිත්‍රතා අංශයට කිසිදු සේවාවක් ලබා නොදුන් දෙදෙනෙකු වෙනුවෙන් රු.354,016ක් ද ගෙවා තිබුණි. | පවිත්‍රතා සේවා ආයතනයට 2022 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා ගෙවීම් කිරීමේදී අංශ ප්‍රධානීන්ගේ හා ඇඟිලි සටහන් වාර්තාව යන දෙකෙන් අඩු සේවක සංඛ්‍යාවක් සටහන් වී ඇති අගයට ගෙවීම් කරන ලද බව හා ආපන ශාලාවක මුළුතැන්ගෙයි පවිත්‍රතා අංශයේ යම් අයෙකු සේවය කරතොත් ඒ පිළිබඳව සුපරීක්ෂණය කර පියවර ගතයුතු වන්නේ අදාළ පවිත්‍රතා ආයතනය බැවින් අදාළ පාර්ශවයන් දැනුවත් කර ඉදිරියේ දී මෙවැනි සිදුවීම් වළක්වා ගැනීමට කටයුතු කරන බව. | සේවක පැමිණීම නිවැරදිව තහවුරු කර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | විශ්වවිද්‍යාල සිසුන්ගේ සංචලනය සඳහා වූ යුරෝපීය ප්‍රජා ක්‍රියාකාරී යෝජනා ක්‍රමයේ (European Community Action Scheme for the Mobility of University Students / ERASMUS) ව්‍යාපෘති ප්‍රතිපාදන මඟින් විදේශ වැඩසටහන් සඳහා සහභාගි වූ නිලධාරීන් 08 දෙනෙකු වෙත ගමන් වියදම් හා සංයුක්ත දීමනා ගෙවීමේදී දෝෂ සහගත ලෙස රු.1,760,745ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවූ රු.489,086ක් 2022 ජුලි 01 සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලයට අදාළ මුදල් ගෙවීමේදී අදාළ අයගෙන් පියවා ගැනීමට කටයුතු කරන බව හා සංයුක්ත දීමනා මෙම ව්‍යාපෘතියට අදාළව දෛනික වියදම් සඳහා දෙනු ලබන මුදලක් බැවින් ඒ සඳහා නැවත පියවීමක් අවශ්‍ය නොවන බව. | වැඩිපුර ගෙවන ලද මුදල ආපසු අයකරගත යුතු අතර අත්තිකාරම් ලේඛනය අනුව අත්තිකාරම් ලෙස ගෙවන ලද සංයුක්ත දීමනා පියවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2022 ජනවාරි මාසයේදී විදේශ ශිෂ්‍යයෙකු සිය අධ්‍යයන කටයුතු අත්හැරිම හේතුවෙන් ඔහු වෙනුවෙන් ලද විදේශීය සිසුන්ගේ ශිෂ්‍යත්ව අරමුදලින් (Foreign Student Scholarship) ඉතිරි රු.3,544,756ක් එම අරමුදල වෙත යැවීමට හෝ රජයේ ආදායමට ගැනීමට හෝ 2022 දෙසැම්බර් 31 දින දක්වාම කටයුතු කර නොතිබුණි. | එම සිසුවා අතරමගදී විශ්වවිද්‍යාලය හැර ගොස් ඇති බැවින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සමග සාකච්ඡා කර මුදල් ආපසු යැවීමට හෝ රජයේ ආදායමට ගැනීමට කටයුතු කරන බව. | ඉතිරි මුදල් අදාළ ආයතනය වෙත යැවීමට හෝ රජයේ ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉඹුල්පේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුගේ පෞද්ගලික ඉල්ලීමකට අනුව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක මාර්ග සංවර්ධන ව්‍යාපෘතියක කොන්ත්‍රාත්කරුවෙකුට විශ්වවිද්‍යාල භූමියෙන් පස් කියුබ් 500ක් නොමිලේ කපා ගැනීමට පාලක සභා අනුමැතිය ලබා දී තිබුණි. පස් රැගෙන ගිය බවට ආරක්ෂක නිලධාරී විසින් ලොග් සටහනක් යොදා තිබුණද, පැමිණි ලොරි රථ හා රැගෙන ගිය පස් ප්‍රමාණය පිළිබඳ කිසිදු තොරතුරක් එහි සටහන් කර නොතිබුණි. | මෙහිදී ආරක්ෂක අංශ කටයුතු කර ඇති කාර්යය පිළිගනු නොලබන අතර එබැවින් ආරක්ෂක සේවය ලබා ගෙන ඇති අදාළ සමාගම දැනුවත් කොට මෙවැනි කටයුතු නිවැරදි කිරීමටත් ඉදිරියේදී ආරක්ෂක සේවාවන් ලබා ගැනීමේ දී මෙවැනි නිර්ණායක සඳහා විශේෂ අවධානයක් ලබා දීමටත් කටයුතු කරන බව. | විශ්වවිද්‍යාලයට අයත් නොවන කාර්යයන් සඳහා පාලක සභා අනුමැතිය ලබා නොදිය යුතුය. |
| (ආ) | ව්‍යාපෘති 10ක් සඳහා අදාළ ආයතන වෙතින් ලද මුදලින් ඉතිරිව තිබුණු | අවසන් කරන ලද ව්‍යාපෘතිවල ඉතිරිව තිබූ මුදල් දීමනා ලෙස | විධිමත් අනුමැතිය විගණනය වෙත |

| | | | |
|---|---|---|---|
| | රු.745,813ක් විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට දීමනා ලෙස ගෙවා තිබුණ ද, ඒ සඳහා වූ විධිමත් අනුමැතිය විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | කාර්ය මණ්ඩලයට ගෙවීම මීට ඉහත දී ලබා ගත් (2015 දී පමණ) අනුමැතියකට අනුකූලව සිදු වන නමුත් අදාළ අනුමැතිය මේ වන විට සොයා ගැනීමට නොහැකි විය. අදාළ අනුමැතිය නැවත අලුත් කර ගැනීමට කටයුතු කරන බව. | ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය මගින් කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙනුවෙන් බෙලිහුල්ඔය ප්‍රදේශයේ හෝටලයක පවත්වා තිබුණු රාත්‍රී සාදයක් (Networking Night) සඳහා රු.460,000 ක් වැය කර තිබුණි. | විවෘත හා දුරස්ථ අධ්‍යාපන ඒකකය (CODL) මගින් සෑම වර්ෂයකම උපාධි හා සහතික පත්‍ර ප්‍රදාන උත්සවයෙන් පසුව විවෘත හා දුරස්ථ අධ්‍යාපන ඒකකයේ කාර්ය මණ්ඩලයේ කැපවීම ඇගයීම සඳහා උපකුලපතිතුමා, පීඨාධිපතිවරුන්, අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලයේද සහභාගීත්වයෙන් අදාල අනුමැතීන්ට යටත්ව මෙම Network Night පවත්වන බව. | රජයේ අරමුදල් ඵලදායි කාර්යයන් සඳහා වැය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.4 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය<br>---------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>--------------------------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|
| විශ්වවිද්‍යාලය සතු මෝටර් රථයක් සඳහා ඉකුත් වර්ෂ 06ක් වෙනුවෙන් සුඛෝපභෝගී බදු නොගෙවීම හේතුවෙන් බදු මුදලට අමතරව රු.177, 500ක දඩ මුදලක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්මේන්තුව වෙත ගෙවා තිබුණි. | ඉදිරියේදී මෙවැනි දෑ සිදු නොවීමට කටයුතු කරන බව. | සිදුව ඇති අලාභය වගකිවයුතු පාර්ශවවලින් අයකර ගැනීමට පියවර ගත ගත යුතුය. |

**3.5 ප්‍රසම්පාදනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>------------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>-------------------------------------- | නිර්දේශය<br>------------ |
|---|---|---|---|
| (අ) | වෛද්‍ය පීඨය සඳහා Optical Mark Reader යන්ත්‍රයක් මිලදී ගැනීමේදී අදාළ කාලය තුළ ලංසු ඇගයීමට කටයුතු කර ලංසුව පිරිනැමීමට කටයුතු නොකිරීම නිසා ඇති වූ මිල විචලතා හේතුවෙන් රු.1,270,585ක අලාභයක් විශ්වවිද්‍යාලයට සිදුවී තිබුණි. | පළමු වසරේ සිට අවසන් වසර දක්වා වෛද්‍ය පීඨයේ සියලුම විභාග සඳහා මෙම යන්ත්‍රය අත්‍යවශ්‍යම වූවකි. රට තුළ එවකට පැවති තත්ත්වය මත බොහෝ සමාගම් OMR යන්ත්‍රය සැපයීමට නොහැකි බව දන්වා තිබුණද, වෛද්‍ය පීඨයේ ඉල්ලීම මත ලංසු කැඳවා මෙම | නියමිත කාලය තුල ලංසු ඇගයීම් කටයුතු සිදු කර රජයට උපරිම ආර්ථික වාසි සලසා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අත්‍යවශ්‍ය අයිතමය විශ්වවිද්‍යාලයට ලබා දීමට කටයුතු ඇත. | |
| (ආ) | විද්‍යා හා තාක්ෂණික මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (STHRD) යටතේ 2021 වර්ෂය තුළ රු.25,871,615කට විවිධ පොත් ඒකක 839ක් මිල දී ගැනීම සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.10 මාර්ගෝපදේශයට පටහැනිව සැපයුම්කරු තෝරාගෙන තිබුණි. ඒ අනුව, පොත්පත්, වාර සඟරා සැපයුම් පිළිබඳ පූර්ව අත්දැකීම් රහිත ආයතනයකින් සමස්ත ප්‍රසම්පාදනයෙන් සියයට 74ක් හෙවත් රු.21,062,900ක් වටිනා පොත් 449ක් මිල දී ගෙන තිබුණි. ඉන් පොත් 97ක මිල, වර්තමාන වෙළඳපොළ මිලට වඩා ඉතා ඉහළ අගයක් ගැනීම හේතුවෙන් රු.5,611,926ක මූල්‍යමය පාඩුවක් සිදු වී තිබුණු අතර රු.4,516,000ක් වටිනාකමැති පොත් 61ක් පරිහරණය කළ පොත් (used books) බව අනාවරණය විය. එම පොත්වලින් රු.2,499,400ක් වූ පොත් 14ක් මිල දී ගැනීමේ අවශ්‍යතාව අපැහැදිලි විය. එසේම මිල දී ගැනීමේ පැවැති විවිධ දුර්වලතා හා අන්තර්ජාලයෙන් නොමිලේ බාගත කළ හැකි අත්පත්‍රිකා වෙනුවෙන් ගෙවීම් කිරීම හේතුවෙන් රු.565,650ක අලාභයක් ද සිදුවී තිබුණි. | ත්‍රිපුද්ගල කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුව විසින් ඒ පිළිබඳ කටයුතු සිදුකරමින් පවතින බව. | පරීක්ෂණ කඩිනම් කර වගකිවයුතු තැනැත්තන් නිශ්චය කර රජයට සිදු වූ අලාභ අයකර ගැනීමට පියවර ගත යුතුය. |

**3.6 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යාපීය ගොඩනැගිලි සංකීර්ණය ඉදිරිකිරීමේ ව්‍යාපෘතියේ දෙවන අදියර - I කොටස රු.452,409,980ක (VAT සහිත) කොන්ත්‍රාත් වටිනාකමකට 2018 නොවැම්බර් 18 දින ඉදිකිරීම් සමාගමක් වෙත පවරා තිබුණි. මෙම ව්‍යාපෘතිය design & built (Turnkey) කොන්ත්‍රාත්තුවක් වන බැවින් එහි අනුමත පිරිවැය හා සැලසුම් | මෙම ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා මූලික ලේඛන සකස් කර ඇත්තේ 2014 වර්ෂයේ දීය. ඒ වන විට පීඨයේ අධ්‍යයන අංශ 05 ක සිටි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 980කි. දැනට මෙම පීඨයේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව 1487 ක් වන අතර මේ වන විට වාර්ෂික බඳවා | නිර්මාණය කර ගොඩනැගීමේ (Design & Built) කොන්ත්‍රාත්තු වලදී අනුමත පිරිවැය හා සැලැසුම සංශෝධනය නොකළ යුතුය. එමෙන්ම විශ්වවිද්‍යාලයක පීඨ |

සංශෝධනය නොකළ යුතු වුවත් අමතර ප්‍රතිපාදන සලසා ගැනීමකින් ද තොරව රු.24,625,295ක අමතර වැඩ අනුමත කර තිබුණි. බදු සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන වෙනත් ගෙවීම් සඳහා භාවිතා කළ නොහැකිව තිබියදී, එකතු කළ අගය මත බදු (VAT) ප්‍රතිශතය සියයට 15 සිට සියයට 8 දක්වා අඩු කිරීමෙන් වූ බදු ඉතිරිය යොදවා අමතර වැඩ සඳහා ගෙවීම් සිදුකර තිබුණි. අවසන් බිල්පත තුළ Solar energy system සඳහා රු.3,000,000ක් ගෙවීම් කිරීමට ඉදිරිපත් කර තිබුණද, එම වැඩ විෂයය ප්‍රමාණවත් ලෙස නිමකර නොතිබීම හේතුවෙන් ගෙවීම අත්හිටුවා තිබුණි. එමෙන්ම, අමතර වැඩ ඇස්තමේන්තුව තුළ වැඩ විෂයයන් 02කට අදාළව රු.6,579,931ක් හා මුල් ඇස්තමේන්තුව තුළ ඇතුළත් solar street lighting system සඳහා රු.3,600,000ක් ගෙවා තිබුණද ඊට අදාළ මුල් සැලසුම් හා යෝජනා ලබාගෙන නොතිබුණි. තවද, අමතර වැඩ සඳහා රු.328,269ක් ද වැඩිපුර ගෙවීම් කර තිබුණි.

ගැනීමේ ශිෂ්‍ය සංඛ්‍යාව 833 දක්වා වැඩි වී ඇත. මෙම වැඩි වන ශිෂ්‍ය ප්‍රජාවට අවශ්‍ය පහසුකම් සපයා දීමේ මූලික අරමුණින් යුතුව මෙම විචලන / සංශෝධන කර ඇති බව හා මුල් ලේඛන සකස් කිරීමේ දී පීඨයේ කාර්යය මණ්ඩල නියෝජිතයන්ගේ සහභාගිත්වය සහ අදහස් ලබා ගැනීම සිදුකර ඇති බව.

ගොඩනැගිල්ලක් ඉදිකිරීමේදී ඉදිරි වසර ගණනාවකදී සිදුවිය හැකි වෙනස්කම් පිළිබඳ අවධානය යොමු කළ යුතුය.